# නෙත් කැළුම්

**කපෝචනයේ දමිත හිමි**

ජීවක අඹ වනය - වෙත පියනගන මෙහෙණකි
අගපත් සෙයින් රූසිරින් - සුබා නම් වූවාය ඕ
නෙත නොලා වටපිටා - සත්සුන් ගමන් යන්නී
රාසිත් දූමු ඈ - සුව විඳියි ලද සතුට.

නිසසලේ පිය මනින - ඈ කෙරේ ආලයෙන්
උමතු වූ සලෙළෙකු - මග රැක ඉඳී දෙඇස දල්වා
සව් කෙලෙසුන් කෙරෙන් - මිදී ලැබගත් නැණ බෙලෙන්
ඔහු සතු සරා අදහස් - දැනගෙන ඕ කීය මෙලෙසින්.

සිකපදින් පිරිසිදුව - සම්බුද්ධ සාසනේ
නිකෙලෙස්ව දිවි ගෙවන - බුදුසච්වක්මි අරහත්
රාගයෙන් ඔද වැඩුණු - සිතින් පහසක් විඳින අටියෙන්
මා යන මග අවුරනු කිම? - එය දොසෙකි හිතවත.

බස් අසා රාගයෙන් - කීය සලෙළා ආදරෙන්
රූසිරින් තරුණයි - කියනු දොස් නෑ රුව නුඹේ
ඇඳි සිවුර ඉවතටම - උනා ගෙළ වැලඳ මා හා
ඇති තරම් කම් සුවෙන් - නිවසමු වනේ සතොසින්.

පිපී තුරු අග කුසුම් - පෙමින් රඟදේ වසත් රිතුවේ
මල් සුවඳ මුසුව එන - මදනල ද ගතට සිහිලෙකි
හුදකලා දිවි ගෙවන - නුඹට දෙන්නෙමි නොවක් සෙනෙහස
නොදැනේද? මේ වනේ - ඉතිරියක සතු තනිකමක් හද.

මනැතුන් සැඬමුවන් - වගවලසුන් ගහණ අරණේ
තනියම නුඹට මොන - රතියක් ඇත්ද? සිත තුළ
සොබාදම පිරි මෙවන - පෙම්වතුනගේ රජදහන වේ නිති
"දිවසිතුලිය" වනේ - රුවැති දෙවඟන ඔබය සිත්ගත්.

අඬවන් සුනෙත් ඇති - සඳකිඳුරියකි මියුලැසිය නුඹ
රනින් කළ රුවක ලෙද - මා මන පුබුදු කරවයි
දිවි වුව ද දෙන්නෙමි - ඔබ මගේ වසඟයට ආවොත්
තවද දැසිදස්සන් - ලවා සිතුසේ සලකවමි මම්.

මුදු බඳ සරසවම් - කසී සළුවෙන් බරණැස
මල්දම් සුවඳ විලවුන් - ගතේ දවටා තබන්නම්
රජස්හල උඩුවියන් - සුපිරිසිදු කොඳු පලස්
සුදු සඳුන් තැවරූ - යහන් සැතපෙන්න නිති දෙමි.

යකුන්ගෙන් අරක්ගත් - බියකරු විලෙක සුපිපුණ
නිල් උපුල් මලක් මෙනි - රස ලොවේ කිසිත් නොදකී ඔබ
බඹසරම සුරකිමින් - මන වඩන සිරුර නුඹෙ
දිරාපත්වන්න ඉඩ හැර - ඇයි ද ඉන්නේ තපෝවන මැද.

මුළාවී ඇත්තටම - ඔහු කියූ ඒ වදන්
අසා සිටි තෙරණියෝ - පිලිවදන් දුනි මේ ලෙසින්
ජරා අසුචියෙන් පිරි - බිඳෙන බඳුනක් සේය මසිරුර
අමු සොහොන සතු එය - වටින්නේ නැත. කුමට රුවටෙ ද?

රූ සිරින් උමතු වූ - සලෙලා එබස් විසිකොට
සරාගික මත් මතින් - මෙසේ ඇය ගැන වනන්නට වී
කිඳුරඟනකගේ නෙත් - මුවඟනකගේ දිගු නෙත්
පැරයූ ඔබ නුවන් - මගේ දෙනුවන් එයම ඉල්ලයි.

පිරිසිදු වූ නෙතැත්තිය - වෙන්වුවත් මා දෙනයනින් ඔබ
නිලුපුල් සදිසි ඔබ නෙත් - මා සිතින් ගිලිහී නොයේ
බුර බුරා නැඟී එන - ආල සිතිවිලි නිමි නොවේ
ඔබෙන් තොර ලොවක් මට - ඇත්තේම නැහැ මෙ සක්වල.

මේ ලෙසින් බැගෑපත් - වූ සලෙළ දෙස බැලූ
අරහත් සුබා මෙහෙණිය - කුළුණු මෙත් සිතින් කියනෝ
කොතෙකුත් කතුන් ඇත - කිම ද මා වෙත කරන කරදර
මා වෙසෙන මේ දිවිය - පිරිසිදුය දුරු කෙලෙන් රාගය.

මාවතම පැහැදිලිය - ඔබ කටු මග නොයනු මැන
කෙළිබඩුවක් ලෙසින් - හඳ ඉල්ලා ඇයි ද තව දුක්?
කිසිවෙකුටවත් බැරි වූ - මහමෙරින් බැහැ පනින්නට ඔබටත්
තව කුමට නුඹෙ නෙත - මා දෙසම හෙළනුයේ.

ගිනි වළකට හෙලූ - දණ්ඩක් ලෙසින් දැවුණු
විස බඳුන බිමට නතු - වූ සෙයින්, නොමැත මට රාගයක්
බිඳු ඇසුරක් නොමැති - අඟනක් ලබා නුඹ වැනි
ලාමක පස්කමින් - විසුව මැන සහතොසින්.

රන්මුවා රුවක මෙන් - සිහිනයෙන් නෙත ගැවුන
අත්බූත පිදී රුව - වැනිය මේ කය මගේ
තවත් නුඹ මා කෙරේ - කුමට ඇල්මෙන් බැඳී ඉන්නේ
නිබඳ මම සිහිකරමි - පස්කඳම අනිසි බව.

කබ කඳුලැලි පිරෙනා - ඇසෙහි නැත කිසි දෙයක් ඉමිහිරි
සිරුර ද කුණු ගොඩකි - එහි ද නැත කිසි දෙයක් මනහර
පසිඳුරන් ඇලුම් නැති - ඇයට නැත කිසි ලොබක් ඇස ගැන
අතින් උපුටා සැණින් - ඇසක් දුන්නා ගැලූ ලේ කඳුළු අතරින්.

සැබවින්ම පුදුමයකි - ඔහුට එය අදහනුම බැරි විය
බිය මුසු දුක් හඬින් - රාසින් තුරන්වී, සමා ඇයදී.
ඔහු කෙරෙන් සමුගත් - සුබා තෙරණිය සුගත හිමි දැක
සුපුරුදු ලෙසින් යළි - දෙනෙත් ලැබ නිති සුවය වින්දා.

(ථෙරී ගාථා පාළි — සුබා ථෙරී වත.)

**1982.02.16 දින.**



6. මු.ස. 861064